**ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව.**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

**(ආ)** මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මාගේ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය අවසාන දිනට භෞතික ශේෂය පදනම් කරගෙන වර්ෂය අවසාන තොගය ගණනය කර ගිණුම්වල පෙන්විය යුතු වුවද, පොත් ශේෂය පදනම් කරගෙන තොග වටිනාකම රු. 7,658,718,321 ක් ලෙස ගණනය කර තිබුණි. | කාර්ය මණ්ඩල ඌනතාවය මත නිවැරදි මූලාශ්‍ර තොරතුරු වෙත ප්‍රවේශවීමේ අපහසුතාවය. | වර්ෂය අවසාන තොග වටිනාකම භෞතික ශේෂය පදනම් කරගෙන ගණනය කළ යුතුවීම. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

---

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති ගබඩා අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්වල ශේෂ හා මාසික ගිණුම් සාරාංශ අනුව මුදලින් ලැබීම් හා ගෙවීම් අතර පිළිවෙලින් රු. 46,654 ක හා රු. 393,996,074 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | ගිණුම්මෙහි සංඛ්‍යා මාසික ගිණුම් සාරාංශ සමඟ නොසැසදේනම් වෙනසට හේතු සොයාබලා වාර්තා කළ යුතුවීම. |

## 1.6.3 දේපල පිරියත හා උපකරණ

-------------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ---------- |
| (අ) | දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවේ දක්වා නොතිබුණද, මාසික ගිණුම් සාරාංශවල 9153 සංකේත අංක යටතේ ඉඩම් සඳහා හර කිරීම් රු. 409,739,091,732 ක් හා බැරකිරීම් රු. 77,072,687,967 ක් ලෙස සටහන් කර තිබුණි. | 2020 වර්ෂය තුලදී ප්‍රධාන කාර්යාලය හා උප දෙපාර්තමේන්තු 03 ක පමණක් වත්කම් ගිණුම්ගත කිරීමේ CIGAS වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සිදු වූ නිසා මෙසේ සිදු වී ඇති බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේදී රු. 30,563,559,457 ක් වටිනා වත්කම් මිළදී ගෙන තිබුණද භාණ්ඩාගාර මුද්‍රිතවල (SA 82) මිළදී ගැනීම් කිසිවක් දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේදී CIGAS වැඩසටහන හරහා වත්කම් ලැයිස්තුව පවත්වා ගැනීමේ නොහැකියාවකට දෙපාර්තමේන්තුව පත් වීම මෙයට හේතු වී තිබුණි. | වත්කම් මිළදීගැනීම් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වේ. |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම්වලට අදාළව මූල්‍ය ප්‍රකාශවල අගයන් හා භාණ්ඩාගාර මුද්‍රිතවල අගයන් අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ් අනුව පිළිවෙලින් ආරම්භක ශේෂ අතර රු. 417,717,025,337 ක, අවසාන ශේෂ අතර රු. 234,911,103,947 ක හා අපහරණ වටිනාකම් අතර රු. 152,213,895,645 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | -එම- | වෙනස්කම්වලට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් දේපළ හඳුනාගෙන ඒවායේ අයිතිය තහවුරු කරමින් ඒවායේ නිවැරදි වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.4 ගබඩා අත්තිකාරම් ගිණුම**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ------------ |
| (අ) | ගබඩා අත්තිකාරම් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව සමාන විය යුතු වුවද, රු. 403,366,221 ක් අඩුකර භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂයට සමානකර තිබුණි. මෙම අධි තක්සේරුවීම් සිදු වී ඇත්තේ කුමන තොග අයිතමයන්ගේද යන්න පිලිබඳ ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම ශේෂය ගිණුම තුලනය කිරීම සඳහා යෙදූ අවිනිශ්චිත ශේෂයක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | දිගුකලක සිට පැවත එන පැරණි ශේෂ බැවින් නිරවුල් කිරීමේ දැඩි අසීරුතාවයක් පවතින බව අවධාරණය කරමි. | අධි තක්සේරුවීම් ලෙස ගිණුමේ දක්වා ඇති ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ආනයනික භාණ්ඩ සඳහා ගෙවීමේදී ලියකියවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත බැංකුව විසින් අයකරන ලද රු. 12,584,035 ක පොළී වටිනාකම තොග වටිනාකමට එකතු කර තිබුණි. තවද විදේශීය මිළදීගැනීම්වලට අදාළව නැව් සංස්ථාවට අදාළ ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 3,520,605 ක්ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියට රු. 1,412,528 ක්ද හා<br><br>පෞද්ගලික ආයතනයක් වෙත රු. 1,000,550 ක්ද වශයෙන් ගෙවන ලද එකතුව රු. 5,933,683 ක ප්‍රමාද ගාස්තුද තොග වටිනාකමට එකතු කර තිබුණි. මේ හේතුවෙන් වාර්ෂික තොග ලැබීම්වල වටිනාකම රු. 18,517,718 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ආනයනික භාණ්ඩ සඳහා ගෙවීමේදී ලියවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත බැංකුව විසින් අය කරන ලද රු. 12,584,035 ක පොළී වටිනාකම භාණ්ඩ ආනයනය මත දැරූ වියදමක් බැවින් එම මුදල තොගයට ගලපා ඇත . | තොග වටිනාකමට එකතු කළ හැකි වියදම් පමණක් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1993 වර්ෂයේ සිට මේ දක්වා භාණ්ඩ ආනයනයේ දී රේගු ගාස්තු වශයෙන් දරන ලද රු. 94,559,163 ක වියදම මෙතෙක් තොගයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී භාණ්ඩ ලැබීම් පත්‍ර කඩිනමින් ලබාගෙන මෙම ශේෂයන් තොගයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රේගු ගාස්තු වැනි ඍජු වියදම් තොගයට ගැලපීමට කටයුතු කළ යුතු වේ. |

## 1.6.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

-----------------------------------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------------- | ------------- |
| (අ) | 2020 වර්ෂය ආරම්භයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු. 4,177,805 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එය 2004 වර්ෂයේ සිට පැවත එන්නකි. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම් ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු. 1,110,101 ක වෙනසක් පැවතුණි. | ශේෂ කපා හැරීමට ප්‍රමාණවත් තොරතුරු විශ්‍රාම අධ්‍යක්ෂක වෙතින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් නොලැබීම මේ සඳහා හේතු වී තිබුණි. | -එම- |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ලැබීම් හා ගෙවීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මාසික ගිණුම් සාරාංශ අනුව ණය ගෙවීම් හා ණය අයකර ගැනීම් අතර පිළිවෙලින් රු. 118,301,258 ක සහ රු. 192,649 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේදී ඒ පිළිබඳවද සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමට අදාළ අංශවලට උපදෙස් දී ඇති බව. | -එම- |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛණයක් පවත්වා නොතිබුණි. | කාර්යාල සේවය සඳහා යෙදිය යුතු නිලධාරීන් සංඛ්‍යාව අවම වීම හා එම තනතුරුවල පුරප්පාඩු ප්‍රමාණය අධික ය. එම හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 14000 කට ආසන්න පිරිසකගේ වැටුප් සැකසීමේ ක්‍රියාවලිය තුළ සියළුම අංශ සඳහා පුද්ගල පඩිනඩි ලේඛණ සකස් කිරීම සහ යාවත්කාලීන කිරීමේ අසීරුතාවයක් පවතී. | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 454 (1) ප්‍රකාරව බඩු ලේඛණ පොත යාවත්කාලීන කර නොතිබුණි. | උප දෙපාර්තමේන්තු සඳහා එක් එක් අංශ මට්ටමින් බඩු ලේඛණ පොත් පවත්වා ගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි 454 (1) හි විධිවිධාන ප්‍රකාරව බඩු ලේඛන පොතක් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වේ. |
| (ඇ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව උප දෙපාර්තමේන්තු 09 කට අදාළව බැරකම් පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණි. | උප දෙපාර්තමේන්තු සඳහා බැරකම් පිළිබඳ ලේඛනය පවත්වා ගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වේ. |
| (ඈ) | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය ලේඛණ (CC 10) කාර්තු වශයෙන් ශේෂ කර නොතිබුණි. | කාර්තුමය වශයෙන් ශේෂ කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇති බව. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය ලේඛණ CC 10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛණ යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. |

## 1.6.7 ගණන්දීමේ නිලධාරී විසින් සිදුළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී කලින් කලට සමාලෝචනය කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු. 848,334,880 ක් වූ අතර බලපත්‍ර 01 ආදායම යටතේ අවු. 23 ක ටත් පෙර සිට පැවත එන රු. 769,194 ක ශේෂයක් අයකර ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. බලපත්‍ර 02 හිඟ ආදායම යටතේ අයවිය යුතු රු. 847,565,686 ක මුදලින් සියයට 55ක්ම වර්ෂ 05 ඉක්ම වූ හිඟ ශේෂ විය. | බලපත්‍ර අංක 01 හිඟ ආදායමට අදාළ විස්තරාත්මක ලේඛනයක් නොමැති බවත් බලපත්‍ර 02 ගිණුමේ 2020.12.31 දිනට හිඟ ආදායම වන රු. 847,565,686 න් 2021 මාර්තු මස වන විට රු. 119,333,490 ක මුදලක් අය කරගෙන ඇති බව. | පැරණි හිඟ ආදායම් ශේෂ කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 31 කින් රු. 118,934,728 ක මුදලක් හිඟ හිට තිබූ අතර ආයතන 16 කින් ලැබිය යුතු රු. 20,307,403 ක හිඟ මුදල් වර්ෂ 20 කට වඩා පැරණි ශේෂ විය. | මෙම ආයතන වර්ෂ ගණනාවක සිට වෙළඳ බිල්පත් ක්‍රමය යටතේ භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් ක්‍රියාත්මකව නොමැත. තව ද වසර ගණනාවක් තිස්සේ දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඇති හිඟ මුදල් නිරවුල් කරන මෙන් එම ආයතන වෙත දැනුම් දී යවන ලද ලිපි එවැනි ආයතනයන් නොමැති බව දන්වා නැවත හරවා එවනු ලැබ ඇත. ඒ අනුව අදාළ හිඟ මුදල් අය කර ගත නොහැකි බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට දුම්රිය ස්ථාන වලින් අයවිය යුතු හිඟ මගී ආදායම රු. 10,879,857 ක්ද, පාර්සල් හා භාණ්ඩ ප්‍රවාහන හිඟ ආදායම රු. 4,992,485 ක්ද, විවිධ හිඟ ආදායම රු. 920,487 ක්ද වශයෙන් මුළු හිඟ ආදායම රු. 16,792,829 ක් විය. හිඟව පවතින කාලපරිච්ඡේදය සැලකීමේදී මගී ආදායම නිරවුල් කර ගැනීමට මෙන්ම පාර්සල්වල හිඟ ආදායම් ඇතිවීම වළක්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අලෙවි වූ ප්‍රවේශපත්‍ර සඳහා නැවත ගෙවූ වටිනාකම් ගිණුම්ගත කර ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් මෙම හිඟ ආදායම් පැනනැඟී ඇති බව. | හිඟ ආදායම් නිරවුල් නොවීමට හේතු සොයාබලා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වෙනත් හිඟ ආදායම් රු. 556,205,725 ක් වූ අතර එම හිඟ ආදායම අවම කර ගැනීමට අවශ්‍ය විධිමත් පාලන පද්ධතියක් සකස් කර ගෙන නොතිබුණි. බඩු ගබඩා ආදායම, ස්ථාවර භෝජනාගාර, වෙළඳ දැන්වීම්, ප්‍රචාරණ හා සුළු වෙළඳ අලෙවිසැල් සම්බන්ධයෙන් හිඟ ආදායම රු. 506,507,273 ක්වූ අතර එය වෙනත් හිඟ ණය වටිනාකමින් සියයට 90 කට වැඩි වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | හිඟ ආදායම් අවම කර ගැනීමට අදාළ විධිමත් පාලන පද්ධතියක් සකස් කර ගත යුතු වේ. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාරය විසින් SA 92 දරන සමුච්චිත බැරකම් වාර්තාවේ දැක්වෙන රු. 75,936,998 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | භාණ්ඩාගාරයේ සමුච්චිත බැරකම් ප්‍රකාශයේ දැක්වෙන බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබිය යුතු වේ. |
| (ආ) | 2020 වර්ෂයේදී නිරවුල් කරන ලද රු. 589,250 ක් වූ දුරකතන බිල්පත් ශේෂයක් බැරකම් ලෙස දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයකින් මෙය සිදු වී ඇති අතර ඉදිරි වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | දුරකතන බිල් ගෙවීම සඳහා වෙනම ලේඛණයක් නඩත්තු කිරීමෙන් මෙවැනි අඩුපාඩු අවම කරගත හැකි වේ. |
| (ඇ) | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව (සැපයීම් හා සේවා නොවන) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳී සිටිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුලදී සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී වැය විෂයයන් 12 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු. 1,733,663,663 ක බැරකම්වලට එළඹ තිබූ අවස්ථා 12 ක් විය. | අත්‍යාවශ්‍ය හා මහජනයාට ඉතාම සමීපව කටයුතු කෙරෙන දෙපාර්තමේන්තුවක් බැවින් ඇතැම් අවස්ථා වලදී මහජන සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදු වේ. එවැනි අවස්ථා වලදී බැරකම් හා බැඳීම් වලට එළඹීමේදී ඉතාම හදිසි තත්ත්වයන් ඇති වන බැවින් නොපමාව කටයුතු කළ යුතුව ඇත. එම නිසා මෙවැනි තත්ත්වයන් ඇති වීම නොවැළැක්විය හැකි වන බව. | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | 2020 ඔක්තෝබර් 09 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 ඡේදය පරිදි සටහන් අංක (iii) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු අතර එලෙස වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2021 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත් රු. 810,810,778 ක බැරකම් භාණ්ඩාගාරයේ SA 92 සමුච්චිත බැරකම් වාර්තාවේ දක්වා නොතිබුණි. | කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සීමිත පිරිසක් පමණක් රාජකාරියට වාර්තා කළ නිසා එම කටයුතු නියමිත පරිදි අවසන් කිරීමට නොහැකි වූ බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(ඉ)** | ඉන්ධන සඳහා සීමා සහිත විවිධ සේවා සමූපාකාර සමිතියට (මොරටුව) ගෙවීමට අදාළ රු. 40,960 ක් වූ බැරකම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු. 91,200,184 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් බැරකම් රු. 91,159,224 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | එක් අයකුගේ කාර්යයන් තවත් අයකුගේ අධීක්ෂණයට භාජනය වන අයුරින් වැඩ බෙදීමක් කළ යුතු වේ. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් (159 ශීර්ෂය) 2020 වර්ෂය සඳහා දුම්රිය ස්ථාන සංවර්ධනය සඳහා ලබා දී තිබූ රු. 7,812,182 ක ප්‍රතිපාදන වලින් උපයෝජනය කර තිබුණේ රු. 19,206 ක් පමණි. | 2020 වසර ආරම්භයේ සිටම පැවැති කොවිඩ් 19 රෝග තත්ත්වය තුළ රටේ ඇති වූ පරිපාලනමය ඇණහිටීමත්, කාර්ය මණ්ඩල සීමා සහිත ලෙස සේවාවන්ට කැඳවා ගැනීමත්, වැනි කරුණු හේතුවෙන් අදාළ කාර්යයන් සඳහා කාර්ය මණ්ඩල යෙදවීමට නොහැකි වූ බව. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන කඩිනමින් උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) 2019 වර්ෂයේදී සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්ත්‍රියානි ආගමික සම්බන්ධතා අමාත්‍යාංශය මගින් අනුරාධපුරයේ විදේශ සංචාරකයින් සඳහා විවේකාගාර ඉදිකිරීම සඳහා රු. 18,930,500 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද 2020 සැප්තැම්බර් 21 දින වන විටත් ඉදිකිරීම් සිදුකර නොතිබුණි. | -එම- | -එම- |

**2.4** **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව එක් එක් මාසයක් අවසානයේ ගණුදෙණුවල තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම පිළියෙල කළ යුතු වුවද, ගබඩා අත්තිකාරම් ගිණුමට අදාළ විදේශ මිළදීගැනීම් සිදුකරන හා විශාල ගණුදෙණු ප්‍රමාණයකට අදාළ ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී (සැපයුම්) අංශයට අයත් අංක 004100209027317 හා 7042682 දරන බැංකු ගිණුම් සඳහා 2020 වර්ෂයට බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී (සැපයුම්)ට අදාළ බැංකු ගිණුම් 02ට අදාළ සැසඳුම් කටයුතු පිළියෙළ කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කළ යුතුවේ. |

**2.5** **අත්තිකාරම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දක්වා නොපිය වූ අත්තිකාරම් ශේෂය රු. 7,957,438 ක් විය. | භාණ්ඩ මිලදී ගැනීම සඳහා 1980 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 39ක කාල පරිච්ඡේදය තුල සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම්වල වටිනාකම පැරණි ශේෂයන්වලින් සකස් වී ඇත. එම නිසා නිවැරදි මූලාශ්‍ර තොරතුරු ලබා ගැනීමෙන් පසු ඉදිරියේදී මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | අත්තිකාරම් ගෙවා ඇති ඒවාට අදාළ භාණ්ඩ ගෙන්වා ගැනීමට පියවර ගත යුතු වේ. |

## 2.6 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 503 ප්‍රකාරව අත්තිකාරම් ගිණුමේ සීමා වෙනස් කර ගැනීම සඳහා අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා සංදේශයක් ඉදිරිපත් කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වන විට ගබඩා අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව අනුමත සීමාව ඉක්මවා ගොස් තිබූ අතර ඒ සඳහා 2021 මාර්තු 31 දක්වාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම සීමා ඉක්මවීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | සීමා සංශෝධනය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2.7 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| **(අ) 2015 අප්‍රේල් 24 දිනැති අංක 3/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය.** | | | |
| **(i)** 03 වන ඡේදයේ V වගන්තිය | වයස අවුරුදු 54 ඉක්ම වූ නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවත්, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කිසිදු උප දෙපාර්තමේන්තුවක එවැනි දත්ත පද්ධතියක් ක්‍රියාත්මක නොවීය. | විශ්‍රාම ලිපිගොනු සම්බන්ධයෙන් දැනට චක්‍රලේඛය පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන අතර ක්‍රමවත්ව වැඩපිළිවෙලක් සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම යාමට නියමිත සියළු නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් සකස් කර යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(ii)** | 04 පරිච්ඡේදය | සෑම රාජ්‍ය නිලධාරියෙකුගේම පෞද්ගලික ලිපිගොනුව නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර වයස අවුරුදු 54 යි මාස 06 න් පසුව යාවත්කාලීන කරනු ලබන ලිපිගොනු නිලධාරියා විශ්‍රාම ගැන්වීමේ දිනය තෙක් වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. එහෙත් පෞද්ගලික විශ්‍රාම ලිපිගොනු 313 ක තොරතුරු විශ්ලේෂණය කිරීමේදී නිරීක්ෂණය වූයේ විශ්‍රාම ගැනීමෙන් පසු අවුරුදු 01 - 06 අතර කාල පරාසයක් ගත වී ඇතත් විශ්‍රාම වැටුප් ගෙවීමට හැකි ආකාරයට ලිපිගොනු 279 ක් යාවත්කාලීන කර නොතිබුණු බවයි. | කාර්ය මණ්ඩල ඌනතාවය ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගැනීම අසීරු බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. |
| **(ආ)** | 2019 ජනවාරි 09 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2015 (සංශෝධන **III)** | විමධ්‍යගත නොකළ විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්කළ යුතු වුවත් විනය හේතු මත විශ්‍රාම ගැනීමේදී නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් නඩත්තු කර ඒවා යථාවත් කිරීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විනය හේතු මත විශ්‍රාම ගැනීමේදී නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කර දත්ත පද්ධතියක් නඩත්තු කිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/ 17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය හා 2018 අප්‍රේල් 27 දිනැති අංක එම් එස් ඩී ඩබ්ලිව්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛය. | තිරසර සංවර්ධනය සම්බන්ධ ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කළ යුතු වේ. |
| **(ඇ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| **(i)** | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන/ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවත්වීම් පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම හා ධාරිතා / නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කළ යුතු වේ. |
| **(ii)** | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 8.1 ඡේදය | දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනයවීම් පරීක්ෂා කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනයවීම් පරීක්ෂා කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(iii)** | 2018 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රමවේදයන් සකස් කළ යුතුවේ. |

**(ඉ)** **ලංකා දුම්රිය සේවයේ පොදු රෙගුලාසි සංග්‍රහය**

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | 3. බී ඡේදය | සෙමින් නිකුත් වන ප්‍රවේශපත්‍ර සම්බන්ධ ඒබී 26 ආකෘතියේ රික්විසිෂන් පත්‍රයක් සකස් කර ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලය වෙත යැවිය යුතු වුවත් එසේ නොකළ රු. 28,628,630 ක් වටිනා ප්‍රවේශපත්‍ර 49,975 ක් තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | ලංකා දුම්රිය සේවයේ පොදු රෙගුලාසි සංග්‍රහයේ අදාළ ඡේද ප්‍රකාර කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | ඡේද අංක 03 හි 3.7 අනු ඡේදය හා 54 වන ඡේදයේ 5.5 අනු ඡේදය | සෑම මසක් අවසානයේදීම අනන්‍යතාව තහවුරු නොකරන ලද පාර්සල් සියල්ලම වෙනම ලේඛණයකට (OUTSTANDING) මාරු කර ඉදිරි පියවර ගත යුතු වුවත් මාතර දුම්රිය ස්ථානය සතු පාර්සල් සම්බන්ධ එවැනි ක්‍රියාමාර්ගයන් මේ දක්වා ගෙන නොතිබුණි. | -එම- | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර තිබූ විදේශීය ශුද්ධ ණය ප්‍රතිපාදනය රු. 29,338,097,000 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වැය සඳහා විදේශීය ණය ලෙස උපයෝජනය කර තිබූ මුදල රු. 25,450,531,877 කි. මේ අනුව උපයෝජනය නොකළ ප්‍රතිපාදනය රු. 3,887,565,123 ක් හෙවත් සියයට 13.25 කි.<br><br>මීට අදාළ අනෙකුත් නිරීක්ෂණ පහත දැක්වේ. | උතුරු දුම්රිය මාර්ගයේ ධාවනය සඳහා වායු සමනය කරන ලද බලවේග කට්ටල දෙකක් ප්‍රසම්පාදනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව රු.මිලියන 843 ක අත්තිකාරම් ගෙවා ඇතත් බලවේග කට්ටල 2020 වර්ෂයේදී මෙරටට ආනයනය කිරීමට නොහැකිවීම, | විදේශීය ණය සියයට 100 ක් උපයෝජනය කිරීමට කිරීමට පියවර ගත යුතු වේ. |
| (i) | විධිවිධාන ප්‍රකාරව සැපයුම් හා සේවා සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද ඇස්තමේන්තු පිළියෙල කිරීම, භාණ්ඩාගාර අග්‍රිම ලබා ගැනීම හා වැය ශීර්ෂ අතර මුදල් මාරු කිරීමේදී අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගනිමින් හා නිසි අයුරින් පුරෝකතනය කර සිදුකළ යුතු වුවත් එසේ නොවූ අවස්ථා විය. 2020 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුලත් විය යුතුව පැවති දුම්රිය ඇණිය වැඩිදියුණු කිරීමට අදාළ රු. 3,607,100,000 ක් වූ දළ පරිපූරක ඇස්තමේන්තුව මගින් ලබාගෙන තිබුණි. | උඩරට දුම්රිය මාර්ගයේ ධාවනය සඳහා ආනයනය කරන ලද බලවේග කට්ටලවලට අදාලව විදේශ ණය ගිණුම්ගත කිරීම සඳහා මෙම රු. 3,607,100,000 ක අමතර ප්‍රතිපාදන ලබා ගන්නා ලදි.<br><br>2020 වර්ෂයට අදාළ ඇස්තමේන්තු පිළියෙළ කරන අවස්ථාවේ මෙම වැය විෂයේ වියදම් දැරීම් සඳහා රු. 10,896,671,000 ක ප්‍රතිපාදන ඉල්ලා තිබිය දී අතුරු සම්මත ගිණුම් මගින් වරින් වර ප්‍රතිපාදන ලබා දීම නිසා ප්‍රමාණවත් ප්‍රතිපාදන | ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු ඉටුකර ගත හැකි වන අයුරින් මුදල් ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | ලැබුණේ නැත. එම නිසා මෙම ව්‍යාපෘතියට අදාළව ලැබුණු අවසන් වියදම් සහතික පත්‍රය වන රු. 6,067,235,669.71 ක වියදම ගිණුම්ගත කර ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමේ අරමුණින් බල අංක 113 යටතේ මෙම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනය ලබා ගන්නා ලදී. | |
| **(ii)** | සමාලෝචිත වර්ෂයේ මුල් මාස 04 සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ නමුත් එම ක්‍රියාකාරී සැලැස්ම තුළ දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු කාර්යභාරයේ නිමවුම හා ප්‍රතිඵල පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) ප්‍රකාශයට පත්කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) ප්‍රකාශයට පත්කිරීමට සහ එහි ප්‍රගතිය ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව පිළිබඳ අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය ආරම්භවීමට පෙර පිළියෙල කළ යුතු අතර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඒ අනුව සිදු කරමින් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(iii)** | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඉදිරිපත් කර තිබූ සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කර නොතිබූ අතර දුම්රිය සාමාන්‍යාධිකාරී යටතේ පවතින අනෙකුත් උප දෙපාර්තමේන්තුවල ව්‍යුහයන් නිවැරදිව හඳුනාගත හැකි පරිදි හා ඊට අදාළව බලතල විමධ්‍යගත වන ආකාරය දක්වා නොතිබුණි. | -එම- | සංවිධාන ව්‍යුහය නිසි පරිදි බලතල හා වගකීම් පැවරෙන අයුරින් පිළියෙල කළ යුතුවේ. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේදී දුම්රිය ස්ථානවල ජල පෙරන සවි කිරීමට අදාල ව්‍යාපෘතිය යටතේ ජල පෙරන සවි කිරීමේ කාර්යය ප්‍රමාද වීම මත රු.1,636,640ක මුදලක් සැපයුම්කරුගෙන් අයකර ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. තවද අනුරාධපුර කොට්ඨාශයේ දුම්රිය ස්ථාන 17ක සවිකර තිබූ ජල පෙරන 17ක් අක්‍රිය වී තිබුණු ඒවායේ වටිනාකම රු.10,211,000ක් විය. | ජල සැපයුම හා විදුලි සැපයුම අදාළ දුම්රිය ස්ථානවලින් ලබානොදීම මත ප්‍රමාද වූ බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ ක්‍රියාවට නැගිය යුතු හා මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින දුම්රිය සංවර්ධන ව්‍යාපෘතීන් 18 ක් හඳුනාගෙන ඇති නමුත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව එම ව්‍යාපෘති 18 න් ප්‍රධාන ව්‍යාපෘති 05 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර සංවර්ධන ව්‍යාපෘති පූර්ව අධ්‍යයනයක් හා අවශ්‍ය තක්සේරුවක් සිදුකළ යුතුවේ. |

(ආ) <u>භාණ්ඩ ප්‍රවාහනය.</u>

| | | |
|---|---|---|
| **(i)** ප්‍රීමා සමාගම විසින් ඔවුන්ගේ නිෂ්පාදන වන පිටි ප්‍රවාහනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ණය පදනමට කන්ටේනර් ෆ්ලැට් **(ii)** බෙඩ් 15 ක් හා කන්ටේනර් 30 ක්ද සහිතව කන්ටේනර් හසුරුවන මැෂිමක් මිළදීගෙන තිබුණි. ඒ්වායේ පිරිවැය ප්‍රවාහන ගාස්තුවෙන් ආවරණය වන පරිදි ගිවිසුමකටද එළඹ තිබුණි. එකී ගිවිසුම අනුව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එක් මසක් තුල ගමන් වාර 20 – 22 ක් අතර ප්‍රමාණයක් ත්‍රිකුණාමලය සිට සීදූව ගබඩාව වෙත සිදුකළ යුතු විය. එහෙත් 2021 ජනවාරි 06 දින සිට පෙබරවාරි 15 දක්වා සිදුකර ඇති ගමන්වාර ප්‍රමාණය 05 ක් පමණක් වන අතර උපයාගෙන ඇති මුදල රු. 2,654,750 කි. | පිළිතුරු ලබා දී නැත. | එම සමාගම සමඟ එකඟ වූ පරිදි භාණ්ඩ ප්‍රවාහනය දුම්රිය මගින් සිදුකර දෙපාර්තමේන්තුවේ ආදායම වැඩි කර ගැනීම කෙරේ අවධානය යොමු කළ යුතුවේ. |
| **(iii)** ප්‍රීමා සමාගම විසින් ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටි ගබඩාවලට මාසිකව ප්‍රවාහනය කරන පිටි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 18,100 ක් වන අතර එම ප්‍රමාණය දුම්රිය මගින් ප්‍රවාහනය කරනු ලබන්නේ නම් දෙපාර්තමේන්තුවට උපයාගත හැකි ආදායම මාසිකව රු. 19,349,687 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව පිටි ප්‍රවාහනයෙන් පමණක් වාර්ෂිකව උපයාගත හැකිව තිබූ ආදායම රු. 232,196,244 ක් වූ නමුත් දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ නිසි අවධානයක් යොමුකර පිටි ප්‍රවාහන ආදායම වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | දුම්රිය මගින් පිටි ප්‍රවාහනය සඳහා පහසුකම් සලසා දී දෙපාර්තමේන්තුවේ ආදායම වැඩිකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| **(iv)** දුම්රිය දෙපාර්තමේන්තුව මගින් 2020 වර්ෂයේ සිමෙන්ති ප්‍රවාහනය තුලින් ලබාගත් ආදායම රු. මිලියන 08 ක් පමණක් වන අතර පසුගිය වසර හා සංසන්දනාත්මකව බැලීමේදී ප්‍රමාණාත්මකව අඩුවීමක් පෙන්නුම් කෙරේ. ටෝකියෝ සිමෙන්ති සමාගම විසින් ඉදිරිපත් කරන ලද දත්ත අනුව හා ඔවුන්ගේ නිෂ්පාදන දිවයින පුරා බෙදාහැරීමේ ජාලය දුම්රිය මගින් සිදුකරනු ලබන්නේ නම් ඒ තුලින් මාසිකව උපයාගත හැකි ආදායම රු. 2,024,492 ක් බව නිරීක්ෂණය විය. මේ අනුව ටෝකියෝ සමාගමේ සිමෙන්ති පමණක් ප්‍රවාහනය කිරීමෙන් වාර්ෂිකව උපයාගත හැකි ආදායම රු. මිලියන 24 ක් වේ. නමුත් දෙපාර්තමේන්තුව විසින් මෙම ආදායම් වැඩිකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නගා නොතිබුණි. | -එම- | ඉහත පරිදි සිමෙන්ති ප්‍රවාහන ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| **(v)** ත්‍රිකුණාමලය වරායේ සිට පුත්තලම දක්වා ගල් අඟුරු ප්‍රවාහනයට හොල්සිම් සමාගම සමඟ දුම්රිය දෙපාර්තමේන්තුව අත්සන් කර තිබූ ගිවිසුම අනුව ගල් අඟුරු ප්‍රවාහනයට පහසුකම් සැපයීම සඳහා මහව දුම්රිය ස්ථානයට යාබදව දුම්රිය අංගනයක් ඉදිකර ඒ සඳහා ප්‍රවේශ මාර්ගයක්ද ඉදිකර දී තිබුණි. වාර්ෂිකව ගල් අගුරු ප්‍රවාහනයෙන් රු. මිලියන 28 ක මුදලක් උපයාගත හැකිව තිබූ නමුත් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් දුම්රිය සහ දුම්රිය වැගන් කළට වේලාවට සැපයීමට අසමත්වීම හේතුවෙන් හොල්සිම් සමාගම ගිවිසුමෙන් ඉවත් වී තිබුණි. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවට වාර්ෂිකව අයකර ගැනීමට තිබූ රුපියල් | පිළිතුරු ලබා දී නැත. | භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සහ දුම්රිය වැගන් කලට වේලාවට ලබා දී දෙපාර්තමේන්තුවේ ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

මිලියන 28 කට වැඩි ආදායමක්ද අහිමි වී ඇති බවත් ඒ හේතුවෙන් අළුතින් සකස් කරන ලද දුම්රිය අංගනය හා ප්‍රවේශ මාර්ගය නිශ්කාර්ය වත්කමක් බවටද පත්ව තිබුණි. හොල්සිම් සමාගම විසින් ත්‍රිකුණාමල වරායට ගොඩබාන ගල් අඟුරු ත්‍රිකුණාමලය සිට පුත්තලමට මහා මාර්ගයෙන් ප්‍රවාහනය කිරීම හේතුවෙන් මාර්ග පද්ධතියට හානිවීම්, මාර්ග තදබදය හා පාරිසරික හේතුවෙන් සමාජ වගකීම ඉටුකිරීමට තිබූ අවස්ථාවන් එමගින් මගහැරී තිබුණි.

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021 මැයි 31 දින වන විටද පිළියෙල කර නොතිබුණි. 2019 වර්ෂයේ කාර්යසාධන වාර්තාවද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි නියමිත කාලයේදී වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ. |

**3.5 ප්‍රසම්පාදනයන්**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉන්දියානු ණය ආධාර යටතේ රු.මිලියන 850 ක් පමණ වැයකර M 11 එන්ජින් 10 ක් මිළදී ගෙන තිබුණි. ඉන්දියාව තුල විවෘත මිළ කැඳවීම් හරහා ප්‍රසම්පාදනය සිදුකළ යුතුව තිබූ නමුත් තනිමූල ප්‍රසම්පාදනයක් (Single Source Procurement) ලෙස මෙම ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. එසේම ලංසුකරුගේ පිරිවිතර, දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද පිරිවිතර හා එකඟ නොවූ අවස්ථා 20 ක් නිරීක්ෂණය විය. තාක්ෂණික පිරිවිතරයේ අඩංගු කොන්දේසි 46 න් කොන්දේසි 17 ක් එනම් සියයට 37 ක් තාක්ෂණික පිරිවිතරයට අනුකූල නොවී තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 මාර්ගෝපදේශය ප්‍රකාරව එය අවලංගු කිරීමට කටයුතු කළ යුතු වුවද එසේ කර නොතිබුණි. තවද ඉන්දීය එන්ජින් මිලදී ගැනීමේ ගිවිසුමේ කොන්දේසි අංක 3.2 අනුව ධාවන අඩුපාඩු පිළිබඳව සලකා පවතින තාක්ෂණික ගැටළු මාස 3න් නිවැරදි කර අනෙකුත් නැව්ගත කිරීම සිදුකල යුතුව තිබූ නමුත් එසේ නොකර නැව්ගත කර තිබුණි. ලංකාවේ දුම්රිය මාර්ගවල තත්ත්වය සැලකීමේදී මෙම එංජින් දිගින් වැඩි වීමේ තත්ත්වය තුල ධාවන ගැටළු මතුවිය හැකිව තිබූ අතර 2021 අප්‍රේල් අවසාන වන විට අදාල එංජින් 10න් 3ක් විවිධ දෝෂ නිසා ධාවනයේ යොදවා නොතිබුණි. තවද, ඇමරිකානු එන්ජින් ඉන්දීය එන්ජින්වලට වඩා ආර්ථික වශයෙන් වඩා ලාභදායී බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කිරීම මත ඉන්දීය එන්ජින් මිළදී ගැනීම නිසා සමස්ත ගණුදෙනුව හරහා රජයට දැරීමට සිදුවන පාඩුව ඇ.ඩො. මිලියන 10.5 ක් හෙවත් රුපියල් මිලියන 1,905.23 ක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) අනුව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ 2016, 2017, 2018 හා 2019 වර්ෂයන්හි අදාළ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල CNC Vertical Turret Lathe යන්ත්‍රය මිළදී ගැනීම ඇතුලත් කර නොතිබියදී 2019 ජනවාරි 07 දින රු.47,072,562ක වටිනාකමට එය මිළදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 අ, ආ ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භයේ සිට අවසානය දක්වා එක් එක් ක්‍රියාවන්හි පියවර, කාල ක්‍රමානුගතව විස්තර කර ප්‍රසම්පාදන කාල සටහන් සකස් කර නොතිබුණි. තවද පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම, ගිවිසුම්ගතවීම හා විශේෂයෙන් අදාල ගිවිසුම දෙපාර්මේන්තුවේ නීති අංශය මගින් පරීක්ෂාවක් සිදුකිරීම යන කරුණුවලදී ද ගැටළු මතුව තිබුණි. මෙම ගනුදෙනුවට අදාල ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු ලෙස යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු පත්කර තිබූ අතර ඔහු වෙනුවෙන් මෙම කාර්යය සඳහා රු.708,142 ක මුදලක් දරා තිබියදී ඔහු විශ්‍රාම යන තෙක් ඔහුගේ සේවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සියළු මිළදී ගැනීම් ප්‍රසම්පාදන සැලැස්මකට අනුකූලව සිදුකළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු වේ. |
| **(ඇ)** | කොටුව හා මරදාන අතර සංවෘත්ත පරිපථ රූපවාහිනී පද්ධතිය (CCTV) ස්ථාපනය කිරීම සඳහා රු. 35,579,668 ක් වැය කර එම පද්ධතිය ස්ථාපනය කිරීම 2013 නොවැම්බර් මස 17 වන දින නිමකර තිබූ අතර වගකීම් කාලය ඉක්මවීමටද පෙර එනම් 2014 ජූනි 12 දින අකුණු සැරයකින් පසු මෙම පද්ධතියේ කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ කැමරා 31 ක ප්‍රමාණයක් සහ මරදාන දුම්රිය ස්ථානයේ කැමරා 17 ක ප්‍රමාණයක් අක්‍රිය වී තිබුණි. තාක්ෂණික ගිවිසුමේ කොන්දේසි අනුව වගකිව යුතු කාලය වසර දෙකක් වුවද එය මෙම වාර්තාවේ දිනය තෙක් සැපයුම්කරු මගින් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. මෙහිදී අකුණුවලින් වන හානිය | පිළිතුරු ලබා දී නැත. | ප්‍රසම්පාදන කටයුතු වඩා විධිමත් ලෙස විධිවිධාන ප්‍රකාරව සිදුකළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ පූර්ව සලකා බැලීමක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවූ අතර සැපයුම්කාර ආයතනය මොරටුව විශ්වවිද්‍යාලයට සම්බන්ධ ආයතනයක් බවට සාවද්‍ය ලෙස සඳහන් කර මෙම කොන්ත්‍රාත්තුව ඉටුකර තිබුණි. මෙම සාවද්‍ය බව අනාවරණය කර ගැනීමට මුල් අවස්ථාවේ අපොහොසත් වී තිබූ අතර එම ආයතනයට විරුද්ධව නෛතිකමය කටයුතු කිරීමට මේ දක්වා අපොහොසත් වී තිබුණි. | | |
| **(ඈ)** | 2021 අප්‍රේල් 21 දිනට වගකීම් කාලය ඉක්මවීමට මසක කාලයක් තිබියදී වටිනාකම රු.18,895,341 ක් වූ වර්ග 3ක අමතර කොටස් නිශ්ක්‍රීයව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. |
| **(ඉ)** | M පන්තියේ දුම්රිය වර්ග 6කට හා w-3 පන්තියේ දුම්රිය එංජින් සඳහා Event Recorder හා Vigilance පද්ධතීන් ස්ථාපිත කිරීම සඳහා රු. 96,931,488 මුදලක් වැය කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිශ්චිත යෝජනා ඉදිරිපත්වීමක්, ඒ පිළිබඳ අධ්‍යනයක් සිදුකිරීමක් හෝ ඒවා සවිකරනුයේ කුමන එංජින් සඳහාද යන්න පූර්ව හඳුනා ගැනීමක් හෝ සිදුකර නොතිබුණි. එම උපාංග සවිකිරීම සඳහා යොදාගනු ලබන එංජින් වර්ග මොනවාද යන කරුණු විටින් විට වෙනස්කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය විධිමත් නොවීම නිසා ඇතිවූ ප්‍රමාදයන් හේතුවෙන් විනිමය අනුපාතය වෙනස්වීමේ බලපෑම මත 2020 මාර්තු 05 දිනට රු1,916,909 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් දුම්රිය එන්ජින් නියමිත කාලයේදී නිදහස් කර ගැනීමට නොහැකි විය. | ප්‍රසම්පාදන කටයුතු කිරීමට පෙර ඒ පිළිබඳ පූර්ව අධ්‍යයනයක් සිදුකළ යුතුවේ. |
| **(ඊ)** | දුම්රියෙන් වැලි ප්‍රවාහනය කළ හැකි බවට ප්‍රසිද්ධ දැන්වීමක් පළ නොකර එක් පෞද්ගලික ආයතනයකට දුම්රියෙන් වැලි ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. මේ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර ගාස්තු තීරණය කිරීමේදී විධිමත් පරිදි කටයුතු නොකිරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | ප්‍රවාහන අමාත්‍යතුමාගේ හා ප්‍රවාහන ලේකම්තුමාගේ උපදෙස් අනුව කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | දුම්රිය දෙපාර්තමේන්තුවට අවශ්‍ය බැලස්ට් කියුබ් 200 ක් මිලදී ගැනීම සඳහා රු.1,323,800 ක වටිනාකමක් වූ කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 හා 8.9.1 මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර විධිමත් ගිවිසුමකටද එළඹ නොතිබුණි. 2021 පෙබරවාරි 15 දිනට කොන්ත්‍රාත්තුව පිරිනමා මාස 15ක් ගතවී තිබුණද එම කාර්ය ඉටුකර නොතිබූ අතර මේ හේතුවෙන් මාර්ගයේ වේගසීමා ඉවත්කිරීමේ කාර්යයක් 2019 ජූනි මස සිට ප්‍රමාද වෙමින් පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. |

**3.6 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදුකෙරේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | ----------- |
| (අ) | 2019 වසර තුලදී දුම්රිය ආරක්ෂක සේවය මගින් අංක RSS/MTL/01/2019 සිට අංක RSS/MTL/51/2019 දක්වා වූ ලිපිගොනු 51 ක් මගින් නීති අංශය වෙත දුම්රිය රක්ෂිතය තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුම් දී තිබුණු නමුත් ඒවා නැවත අත්පත් කරගෙන නොතිබුණි. | නීති නිලධාරීන්ට අවශ්‍ය කටයුතු කිරීම සඳහා උපදෙස් දී ඇත. | අනවසර ඉදිකිරීම් සහ ක්‍රියාකාරකම් සම්බන්ධව නීති කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වේ. |
| (ආ) | <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u> | | |
| | **(i)** දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යාල 917 න් 17 කට අදාළ 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 23 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු වේ. |

| | | |
|---|---|---|
| **(ii)** 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව 2018 මිළදී ගත් වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | -එම- |

(ඇ) <u>ඉඩම් බදුදීම</u>

| | | |
|---|---|---|
| **(i)** දුම්රිය ඉඩම් බදුදීමේදී ඒ පිළිබඳ දත්ත පද්ධතියක් නොවීය. විධිමත් පරිදි ඒවා තක්සේරු නොකිරීම හා විධිමත් ගිවිසුම්වලට නොඑළඹීම මෙන්ම අදාළ බදු ආදායම් නිසි පරිදි අය නොකිරීම හා අවසානයේ ඒවායේ අයිතිය පිළිබඳ ගැටළු මතුවන අවස්ථා නිරීක්ෂණය විය. | -එම- | දත්ත පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| **(ii)** තණවැවීම සඳහා බ.පි. 2630 (1999 දෙසැම්බර් 12) දිනැති පිඹුර යටතේ බදු ලබා දී ඇති පර්චස් 24.80 ක භූමිය සඳහා වූ බදු ගිවිසුම 2019 සැප්තැම්බර් 30 දිනෙන් පසු අළුත් කර නොතිබුණි. රජය සතු මෙම රක්ෂිත ඉඩමේ සන්තකය ආපසු ගැනීමට මෙතෙක් පරිපාලනය විසින් කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | බදුකරු වෙත ඉඩම පරිහරණ ගාස්තු අයකර ඉඩම පරිහරණය කිරීම සඳහා අවසර ලබා දී ඇත. | බදු ගිවිසුම නිසි වේලාවට අළුත් කිරීමටත් අනිසි පරිහරණ වැළැක්වීමටත් පියවර ගත යුතුවේ. |

(ඈ) <u>නිශ්ක්‍රීය වත්කම්</u>

| | | |
|---|---|---|
| **(i)** රත්මලානේ අංක 22 කර්මාන්තශාලාවේ ස්ථාපිත කර තිබූ ටොන් 500 ක් බර රෝද ගැලවිය හැකි Wheel Press යන්ත්‍රය වසර 02 ක පමණ කාලයක සිට ක්‍රියා නොකරන බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | විශාල වටිනාකමින් යුත් යන්ත්‍ර සූත්‍රවලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් පියවර ගත යුතුවේ. |

| | | |
|---|---|---|
| **(ii)** කඩිනම් මිළදී ගැනීමක් ලෙස, අනුරාධපුර ගොඩනැගිලි පරීක්ෂක කාර්යාලය සඳහා 2016 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු. 195,000 ක් වටිනා ගටර්ස් 75 ක් එකී කාර්යය සඳහා භාවිතයට නොගෙන 2020 සැප්තැම්බර් 22 විගණන දින වන විටත් ගබඩාවේ තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මිළදී ගත් භාණ්ඩ අදාළ කාර්යය සඳහා යෙදවීමට කටයුතු කළ යුතුවීම. |
| **(iii)** ත්‍රිකුණාමලය, මාතර,පොල්ගහවෙල සහ අනුරාධපුර යන ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාලවලට අයත් නිල නිවාසවලින් අළුත්වැඩියා කළ හැකි නිවාස 172 ක්ද, පදිංචි විය හැකි මට්ටමේ නිවාස 141 ක්ද වශයෙන් නිල නිවාස 313 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | -එම- | අළුත්වැඩියා සිදුකළ යුතු නිවාස හැකි ඉක්මණින් අළුත්වැඩියා කළ යුතු අතර නිශ්ක්‍රීයව පවතින නිවාස සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ආදායමක් ලැබෙන පරිදි කටයුතු කිරීම. |
| **(iv)** ගලවා ඉවත් කරන ලද ලී සිල්පර කොට වගකිව යුතු නිලධාරියකුගේ අනුමැතිය මත අදාළ ස්ථානවලට භාරදීම සඳහා වූ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හෝ පාලන පරීක්ෂා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතු වේ. |
| **(v)** අනතුරට ලක් වී තිබුණු අංක 50 – 8777 දරන කැබ් රථය විගණිත දින වූ 2021 පෙබරවාරි 02 දින වන විට අනතුර සිදු වී වසර 04 ක කාලයක් ඉක්ම ගොස් ඇතත් එය අළුත්වැඩියා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වාහනය දිරාපත්වීමට ලක්ව තිබුණි. | 2021 පෙබරවාරි 09 දිනැති ලිපිය අනුව අලාභයෙන් 1/5 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත් අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතු බව දන්වා ඇත. | අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු අතර කඩිනමින් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(vi)** | අංක 57 – 8179 දරන ඩබල් කැබ් රථය අළුත්වැඩියාව සඳහා ලබා දී විගණිත දින වූ 2021 පෙබරවාරි 02 දින වන විට වසරකට අධික කාලයක් ගත වී ඇතත් වාහනය අළුත්වැඩියා නොකර නිශ්ක්‍රියව පැවතුණි. | අළුත්වැඩියා කටයුතු කෙරෙමින් පවතින බවත් කොරෝනා වසංගත තත්ත්වය නිසා පින්තාරු කටයුතු ප්‍රමාද වී ඇති බවත් දන්වා ඇත. | -එම- |

**3.7 පාඩු හා හානි**

----------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අනුරාධපුර දුම්රිය වඩු කර්මාන්තශාලාවේ ගින්නක් ඇතිවීම පිළිබඳ පුළුල් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද ඒ තුලින් ගොඩනැගිල්ලට හා එහි තිබූ භාණ්ඩවලට සිදු වූ හානිය පිළිබඳ තක්සේරු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඊට අදාළ ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(ආ)** | දුම්රිය මාර්ගයේ වක්‍රවල (Curve) පවතින ස්ථිර වේගසීමාවලදී අධික වේගයෙන් දුම්රිය ධාවනය හේතුවෙන් 2020 මාර්තු 08 දින දුම්රිය පීලි පැනීමක් සිදු වී ඇති අතර එම පීලි පැනීම යථාවත් කර මාර්ගය පිළිසකර කිරීම සඳහා රු. 216,950 ක වැයක් දැරීමට දෙපාර්තමේන්තුවට සිදුව තිබුණි. මෙම අනතුරින් දුම්රිය එන්ජිම හා මැදිරිවලට වූ හානිය තක්සේරු කර නොතිබුණු අතර ඒ් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ද හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | DOGSPIKES (පරණ සිල්පර ඇණ), Bearing Plates හා Fish plates (යුගල) යන යකඩ, වෙළඳපළ මිළ ගණන් අනුව වෙන්දේසි කිරීමෙන් හෝ ටෙන්ඩර් මගින්<br><br>විකිණීම කෙරෙහි පරිපාලනයේ අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් යකඩ තොගය විකිණීම මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලබාගත හැකිව තිබූ රු. 27,645,400 ක ආදායමක් අහිමි වී තිබුණි. | -එම- | විකිණීම සඳහා කඩිනම් පියවර ගත යුතුවීම. |
| (ඇ) | මල්වතු ඔය පාලම මත ඇති ලී කොට යටට දැමීම සඳහා (Bearing Plates වෙනුවට) Base Plate 500 ක් 2014 නොවැම්බර් 18 දින ලබාගෙන තිබුණු නමුත්, මේ වන තෙක් එම අමතර කොටස් අදාළ කාර්යයට යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | -එම- | මිළදී ගෙන ඇති භාණ්ඩ අදාළ කාර්යයන් සඳහා යෙදවීම තුලින් ප්‍රතිලාභ ලබා ගැනීම. |

## 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද විගණන විමසුම් 12 ක් සඳහා 2021 ඔක්තෝබර් 10 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. | 2020.02.25 දින සිට 2021.05.07 දින දක්වා මෙම දෙපාර්තමේන්තුවට ලැබී ඇති විගණන විමසුම් සංඛ්‍යාව 46 කි. එයින් මේ වන විට පිළිතුරු ලබා දීමට ඇත්තේ විමසුම් 12 ක් සඳහා පමණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු වේ. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෙල් ටැංකි ප්‍රවාහනය කිරීම සඳහා රැගෙනවිත් තිබූ M 11 වර්ගයේ අංක 984 දරන දුම්රිය එන්ජිම 2020 ඔක්තෝබර් 16 වන දින සිට ගාල්ල ධාවනාගාරයේ නවතා තබා තිබූ අතර ගාල්ල දුම්රිය ස්ථානයේ ඇති පයින්ට්ටු (Points) හා Crossover වල දිග ප්‍රමාණවත් නොවන බැවින් මෙම එන්ජිම මෙසේ නවතා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අළුතින් දුම්රිය එන්ජින් මිළදී ගැනීමේදී පවත්නා සම්පත් උපයෝජනය කර ගැනීම කෙරේ අවධානය යොමුකළ යුතු වේ. |
| (ආ) | කොළඹ මහ නගර සභා සීමාවට අයත් දුම්රිය දේපළ 180 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු හිඟ වරිපනම් මුදල රු. 40,627,132 ක් විය. මෙම හිඟ මුදලට අදාළ වන දේපළවල පරිහරණය නිවැරදිව හඳුනාගෙන ගෙවීම් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | නියමිත දිනට වරිපනම් නොගෙවීම නිසා දඩ මුදල් ගෙවීමට සිදුවන බැවින් දේපළවල අයිතිය හඳුනාගැනීමට පියවර ගත යුතු වේ. |
| (ඇ) | 2019 ජනවාරි 07 දින වරායට ලැබී තිබූ CNC Vertical Turret Lathe යන්ත්‍රයට අදාළ ණයවර ලිපි වටිනාකම ගෙවීම සඳහා අවස්ථා 05 කදී දැනුම් දී තිබුණද මුදල් බැංකුගත කර තිබුණේ පෙබරවාරි 18 දිනදීය. එසේ බැංකුගත කිරීම ප්‍රමාදවීම හේතුවෙන් රු. 86,547 ක බැංකු පොළියක් බැංකුව විසින් අයකර තිබුණු අතරම මෙම ගෙවීම් කිරීමට අදාල ප්‍රමාදයන් මත වරාය අධිකාරියට හා නැව් සමාගමට පිළිවෙලින් ප්‍රමාද ගාස්තු ලෙස රු.2,816,576 ක් හා රු. 2,933,031ක් ගෙවීමට සිදුවී තිබුණි. | -එම- | කාර්යක්ෂමව කටයුතු කර මෙවැනි අනවශ්‍ය වියදම් පාලනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | ව්‍යාපෘති නොවන ජපාන ආධාර යටතේ මාර්ග නඩත්තු කටයුතු සඳහා ට්‍රැක් මිණුම් (Track Gauges), හැන්ඩ් ටයි ට්‍රැම්පර් කට්ටල (Hand Tie Tamper Sets) සහ ට්‍රොලි ට්‍රැක් (Trolleys Track) 40 ක් ලැබී තිබූ අතර එයින් 02 ක් අනුරාධපුර ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාලය වෙත 2020 ජනවාරි 05 දින නිකුත් කර තිබුණි. ප්‍රමාණවත් බැලස්ට් නොමැතිවීම හේතුවෙන් එම මැෂින් භාවිතයට ගෙන නොතිබුණි. | -එම- | මෙම යන්ත්‍ර සූත්‍ර වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. |
| **(ඉ)** | භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, එසේ කිසිදු සහතිකවීමකින් තොරව සැපයුම්කරු හට මුදල් ගෙවීම හේතුවෙන් සපයා නොමැති භාණ්ඩ සඳහා රු. 80,189,340 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ගෙවීම් කාර්ය පරිපාටිය විධිමත් කිරීම. |
| **(ඊ)** | 1980 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සෑම වර්ෂයකම නොසැපයූ භාණ්ඩ සඳහා ගෙවීම් කර ඇති අතර මුළු ගෙවීම්වලින් සියයට 42 ක් වූ රු. 33,681,581 ක් 2010 වර්ෂයට පෙර ගෙවීම්ද ඉතිරි සියයට 58, 2010 වර්ෂයෙන් පසු ගෙවීම්ද වන අතර එයින්ද සියයට 40 ක් වූ රු. 31,900,907 ක් 2016 සිට 2020 දක්වා වූ වර්ෂ 05 තුල කර ඇති ගෙවීම් වේ. | -එම- | සපයා නොමැති භාණ්ඩ ලබාගැනීම සඳහා පියවර ගත යුතුවේ. |
| **(උ)** | සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු. 594,378,058 ක් වූ අතර එයින් සියයට 35 ක් වූ රු. 207,564,302 ක් වර්ෂ 03 ත් 22 ත් අතර පැරණි ශේෂයන් විය. මුදල් ගෙවා වර්ෂ 03 කට වැඩි කාලයක් ගත වී ඇති මෙම ශේෂයන් GRN මගින් නිරවුල් නොවීමට හේතු විගණනයට ඉදිරිපත් නොවූ අතර මිලියන 207 කට වැඩි මෙම ගෙවීම්, සපයා නොමැති භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවා ඇති මුදල්ද යන්න විගණනයේදී ප්‍රශ්නගත විය. | පිළිතුරු ලබා දී නැත. | මේ පිළිබඳව නිසි විමර්ශනය කර මෙම ණයවර ලිපි නිරවුල් කිරීමට පියවර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | S 10 – Class Power Coaches සඳහා අවශ්‍ය අමතර කොටස් සඳහා වර්ග 09 ක් යටතේ අමතර කොටස් 663 ක් මිළදීගැනීම සඳහා මිළ ගණන් කැඳවීම් සිදුකළද වර්ග 04 කට අදාළ අමතර කොටස් 540 ක් දැනට අවශ්‍ය නොවන බව දන්වා ඇගයීමෙන් ඉවත්කර තිබුණි. එමෙන්ම මිළදී ගත් අමතර කොටස් වර්ග 04 හිද අවශ්‍ය ප්‍රමාණයට තොග තිබියදී මිළදීගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව ආයතනයේ අමතර කොටස් මිළදී ගැනීමේ අවශ්‍යතාවය තීරණය කිරීම නිසි ක්‍රමවේදයක් මත හා නිසි අධ්‍යයනයක් අනුව සිදුකර නොමැති බවත් අනවශ්‍ය තොග රැස්කිරීම සඳහා රු. 19,515,262 ක මුදලක් වැයකර ඇති බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | මෙමගින් දෙපාර්තමේන්තුවේ අරමුදල් අනවශ්‍ය ලෙස අවුරා තැබීමක් සිදුවන බැවින් එසේ නොවීමට වගබලා ගත යුතුවේ. |
| (එ) | පසුගිය වර්ෂ 16 ක කාලය තුල ගබඩාවේ දුම්රිය අමතර කොටස් තොගය රු. මිලියන 1,905 සිට රු. මිලියන 6,392 දක්වා වූ පරාසයක් තුල පැවති අතර, එම වර්ෂ 16 න් වර්ෂ 14 දීම අදාල මිළදී ගැනීම් වලට වඩා අඩු ප්‍රමාණයක් පමණක් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. එමෙන්ම අත ඉතිරි තොගය වර්ෂ 16 ක කාලය තුලදී තුන් ගුණයක් වී තිබුණි. | සාමාන්‍ය තොගය සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පවතින බව විගණනයෙන් පෙන්වා දී ඇති නිරීක්ෂණය නිවැරදි බව පිළිගනිමි. | ප්‍රමිත තොග මට්ටම පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඒ) | තොග අවශ්‍යතාවයන් හඳුනාගෙන ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා තොග මිළදී ගැනීම සිදුකළ යුතු වුවද අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව තොග මිළදී ගැනීම හේතුවෙන් අවසන් තොග ශේෂයෙන් විශාල වටිනාකමක් භාවිතයට නොගන්නා තොග අයිතම බවට පත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඇති තොග ශේෂයෙන් රු. 298,187,731 ක තොග අයිතම පසුගිය වර්ෂ 05 තුල කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | දැනට පවතින තොග පිළිබඳව නිවැරදි අධ්‍යයනයක් සිදු කර විගණනයෙන් පෙන්වා දී ඇති තොග ශේෂයන් සම්බන්ධයෙන් පසුව සුදුසු පරිදි ක්‍රියා කිරීමට අපේක්ෂා කරන බව. | සීමිත අරමුදල් අනවශ්‍ය ලෙස රඳවා නොගැනීම කෙරේ අවධානය යොමු කළ යුතු වේ. |

**3.10** අවිධිමත් ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------ | ---------- |
| කුරුණෑගල යන්ත්‍රෝපකරණ අධිකාරියෙන් කුලී පදනම මත ලබාගෙන ඇති අංක 68 – 5441 දරන ටිපර් රථය සඳහා මාසික කුලී මුදල්වලට අමතරව ඩීසල් සඳහාද වියදම් දරන අතර 2020 ජනවාරි සිට<br><br>අගෝස්තු දක්වා (අප්‍රේල්, මැයි මාස හැර) කිලෝ මීටර් 16,579 ක් ධාවනය කිරීම වෙනුවෙන් රු. 845,539 ක මුදලක් ගෙවා තිබුණි. 2020 ජූනි 08 සිට 2020 සැප්තැම්බර් 22 දක්වා රු. 112,100 ක වටිනාකමකින් යුතු ඩීසල් ලීටර් 1,180 ක් ලබා දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් ධාවන සටහන් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | දරන ලද ඉන්ධන වියදම් සඳහා අදාළ ධාවන සටහන් පවත්වා ගත යුතු වේ. |

**3.11** මූල්‍ය අක්‍රමිකතා

-----------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------- | ---------- |
| (අ) | 2019 අගෝස්තු 15 දින සිට ඔක්තෝබර් 15 දින දක්වා සේවයට වාර්තා කර නොතිබූ නියෝජ්‍ය දුම්රිය ආරක්ෂක අධිකාරී (ආවරණ) වරයෙකුට එම කාලය වෙනුවෙන් නිවාඩු අනුමත කර නොතිබූ බැවින් 2019 අගෝස්තු 15 දින සිට ඔක්තෝබර් 15 දක්වා වැටුප් වශයෙන් රු. 160,924 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | එම මුදල අදාළ නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ අංශවලට දැනුම් දී ඇත. | දෙපාර්තමේන්තුවේ විවිධ අංශ අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගත යුතුවේ. |

| | | |
|---|---|---|
| **(ආ)** අධ්‍යක්ෂ (පරිපාලන)ගේ 2020 අගෝස්තු 14 දිනැති කැ. 01 ලිපිය පරිදි ඉහත (අ) හි සඳහන් නිලධාරියා 2020 ජනවාරි 09 දින සිට විශ්‍රාමගන්වා තිබියදී 2020 ජනවාරි සිට ඔක්තෝබර් 31 දක්වා රු. 855,235 ක මුදලක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | -එම- | -එම- |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණය පහත දැක්වේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2030 වර්ෂය වන විට ඉටුකර ගත යුතු තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම, ක්‍රියාත්මක කිරීම හා ඒවාට ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුනා ගැනීම හා ඊට අදාළ නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | අපේක්ෂිත අරමුණු කරා ළඟාවීම සඳහා අවශ්‍ය ඉලක්ක හඳුනා ගැනීම සඳහා නිවැරදි දත්ත පද්ධතියක් සකස් කර ගැනීමට පියවර ගත යුතුවේ. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණය පහත දැක්වේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් මහජනයාගේ අවශ්‍යතාවයන්, ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පළ කිරීමට පහසුකම් සලසා නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | වෙබ් අඩවිය මගින් මහජනයාගේ අවශ්‍යතාවයන්, ආයතනය පිළිබඳ චෝදනා, ප්‍රශංසා පළකිරීමට පහසුකම් සැලැසිය යුතුවේ. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල දත්ත අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ත අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 7,335 ක් විය. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 37 ක ප්‍රමාණයකි. දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කාර්ය මණ්ඩලය 335 ක් අනියම් හා කොන්ත්‍රාත් පදනම මත විධිමත් අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 234 ක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අවශ්‍යතා මත පුරප්පාඩු තනතුරු සඳහා අළුතින් බඳවා ගැනීමට පියවර ගත යුතු වේ. |